# සාම්ප්‍රදායික බෙර පද හා ගායනා ප්‍රස්තාරකරණය.

## තුරඟා වන්නම.

- 7 ශ්‍රේණියේ ප්‍රායෝගිකව අධ්‍යයනය කළ තුරඟා වන්නමට අයත් සීරුමාරුව හා අඩව්ව නියමිත තාල රූපයට අනුව ප්‍රස්තාර කිරීම.

- මාත්‍රා 2 + 3 දෙතිත ( සුළු මැදුම් දෙතිත )

**සීරුමාරුව ඃ** කුඳ ගජිජි ගත දොංත ගත් ජිත් ගජිං ජිකුඳ
කුඳ ගජිජි ගත දොංත දොං තා

| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ∧ | | / | | | ∧ | | / | | |
| කු | ඳ | ග | ජි | ජි | ග | ත | දොං | - | ත |
| ගත් | - | ජිත් | - | ග | ජිං | - | ජි | කු | ඳ |
| කු | ඳ | ග | ජි | ජි | ග | ත | දොං | - | ත |
| දොං | - | තා | - | - | - | - | - | - | - |

**අඩව්ව ඃ** තත් තකට තක රොං තත්කඩ තත්කඩ කුඳ තක රොං
තකරොං ගජිං ජිකුඳ කිටි තකට කුංදත් ජික රොං

| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ∧ | | / | | | ∧ | | / | | |
| තත් | - | ත | ක | ට | ත | ක | රොං | - | - |
| තත් | කඩ | තත් | කඩ | කුඳ | ත | ක | රොං | - | - |
| ත | ක | රොං | - | ග | ජිං | - | ජි | කු | ඳ |
| කි | ටි | ත | ක | ට | කුං | - | දත් | - | - |
| ජි | ක | රොං | - | - | - | - | - | - | - |

**ක්‍රියාකාරකම ඃ**

- තුරඟා වන්නමේ සීරුමාරුව හා අඩව්ව ප්‍රස්තාර කර ඇති ආකාරය හොඳින් අධ්‍යයනය කර තනිවම එම පද කොටස් ප්‍රස්තාර කිරීමට අභ්‍යාස කරන්න.

## වෙරොඩ් වන්නම.

- මාත්‍රා 3 තනි තිත ( මැදුම් තනි තිත )

**බෙර පදය ඃ** පිං ගත ගො ගො

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිං | - | ග | ත | ගො | ගො | පිං | - | ග | ත | ගො | ගො |

**තානම ඃ** තනෙන තනෙන තනෙන තනා
තානානෙයි තානානෙයි තානානෙයි තනා
තනෙන තනා තානානෙයි තනා
තානත් තෙයි තන තම්දන තම්ද නාතම්ද නා නා

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | තනෙ | න | ත | නෙ | න | ත | නෙ | න | ත | නා | - |
| තා | නා | නෙයි | තා | නා | නෙයි | තා | නා | නෙයි | ත | නා | - |
| + | තනෙ | න | ත | නා | - | තා | නා | නෙයි | ත | නා | - |
| තා | නත් | තෙයි | තන | තම් | දන | තම් | ද | - | - | - | - |
| + | නා | තම් | ද | නා | - | නා | - | - | - | - | - |

**ක්‍රියාකාරකම ඃ**

- වන්නමේ බෙර පදය හා තානම ප්‍රස්තාර කර ඇති ආකාරය අධ්‍යයනය කර ස්වයං අභ්‍යාස කරන්න.

**කවිය ඃ** 01.
අගය වඩන කවි වරුණා
රඟය දැනෙයි කළ රචනා
මට උරනා නොව මෙදිනා
මහතුගෙ අවසර රැගෙන සමාවා

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | අග | ය | ව | ඩ | න | ක | වි | ව | රු | ණා | - |
| + | රඟ | ය | දැ | නෙයි | - | ක | ළ | ර | ච | නා | - |
| + | මට | උ | ර | නා | - | නො | ව | මෙ | දි | නා | - |
| + | මහ | තු | ගෙ | අ | ව | ස | ර | - | - | - | - |
| + | රැගෙ | න | ස | මා | - | වා | - | - | - | - | - |

**ක්‍රියාකාරකම ඃ**

- වෛරොඩි වන්නම නිවැරදි නාද මාලාවට අනුව ගායනා කිරීමට අභ්‍යාස කරන්න. ඉහත කවිය ප්‍රස්තාර කර ඇති අන්දම හොඳින් අධ්‍යයනයකර වෛරොඩි වන්නමේ පහත සඳහන් කවි ද ප්‍රස්තාර කරන්න.

| | | |
|---|---|---|
| 02 | ඉසුරු දෙවිඳු වඩින | දිනා |
| | කෙහෙතු විමන දැක | නෙතිනා |
| | එම විමනා දෙව් | වඩිනා |
| | කෙහෙතුද දැක කොයි වඩිති | කමාවා |
| 03 | විමන සමඟ කෙහෙතු | දැනා |
| | ඉසුරු දෙවිඳු තුති | දෙමිනා |
| | එම වරුණා කළ | යෙහෙනා |
| | පාතල වෛරොඩි වන්නම | මේවා |
| 04 | ඔබින මෙ සබ තුළ | පැමිණා |
| | කවිය නැතිව බොරු | වරුණා |
| | කළ දුදනා නැත | ඔබිනා |
| | උගතුගෙ බල වැඩි මොකද | පමාවා |

**කස්තිරම ඃ** රුඳ ගත ගත ගත කුංදත් ගජිංත ගත් ජිත් කුංදත්
තකුඳ ගජිං තකුඳ ගජිං තකුඳ ගතට ගත කුඳ කුඳ
ගජිංත ගත් ජිත් කුංදත් ජිකුතක තරිකිට කුංදත් තා

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රුඳ | ගත | ගත | ගත | කුං | දත් | ගජි | ංත | ගත් | ජිත් | කුං | දත් |
| තකු | දග | ජිං | තකු | දග | ජිං | තකු | දග | තට | ගත | කුඳ | කුඳ |

**ක්‍රියාකාරකම ඃ**

- වෛරොඩි වන්නමේ කස්තිරමට අයත් පද කොටස් නිවැරදිව තාල ලබා කියන්න. ඉහතින් ප්‍රස්තාර කර ඇති එම කස්තිරමේ මුල් පද කොටස හොඳින් අධ්‍යයනය කර කස්තිරමේ ඉතිරි කොටස ප්‍රස්තාර කරන්න.

## ඊෂ්වර කුණ්ඩ තාලය.

- මාත්‍රා 3 තනි තිත ( මැදුම් තනි තිත )

**බෙර පදය ඃ** දොදොං දොං ගදිකිට ගදිත දොදොං තා

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| දො | දොං | - | දොං | - | ග | දි | කි | ට | ග | දි | ත |
| දො | දොං | - | තා | - | - | - | - | - | - | - | - |

**තානම ඃ** තෙනා තෙන තෙන තෙම් තෙනෙන තෙන තෙනා

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| තෙ | නා | - | තෙ | න | තෙ | න | තෙම් | - | තෙ | නෙ | න |
| තෙ | න | තෙ | නා | - | - | - | - | - | - | - | - |

**ක්‍රියාකාරකම ඃ**

- සිංදු වන්නමේ බෙර පදය හා තානම ප්‍රස්තාර කර ඇති ආකාරය අධ්‍යයනය කර ස්වයං අභ්‍යාස කරන්න.

**කවිය** ඃ කිපී ලොව දිළෙන තෙද තිලොනිඳුගේ
හැපී දුක් රැසින් උන් සත ගොස් නොලගේ
පිපී වතකමල් විල තඹර නික ලගේ
නො පීනනු කවුද වෙනු සරණ රැස් ගගේ

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| කි | පී | - | ලො | ව | දි | ලෙ | න | තෙ | ද | - | ති |
| ලො | නි | දු | ගේ | - | - | හැ | පී | - | දුක් | - | රැ |
| සින් | උන් | - | ස | ත | ගොස් | - | නො | ල | ගේ | - | - |

**ක්‍රියාකාරකම ඃ**

- නියමිත නාද මාලාවට අනුව සිංදු වන්නම ගායනා කිරීමට අභ්‍යාස කර ඉතිරි කවි පද දෙක නිවැරදිව ප්‍රස්තාර කරන්න.

**ඉරට්ටිය ඃ** දොම් තක තදිකින තරිකිට ගත ගුගුදම් ගුගුදිත් තා
ගත දොහොකඩ තහකඩ දිත් තරිගුම් දිරිගුම් ගුගුදං

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| දොම් | තක | තදි | කින | තරි | කිට | ගත | ගුගු | දම් | ගුගු | දිත් | තා |
| ගත | දොහොකඩ | තහකඩ | දිත් | - | - | තරිගුම් | දිරිගුම් | ගුගු | දං | - | - |

**ක්‍රියාකාරකම ඃ**

- ඉහත ඊෂ්වර කුණ්ඩ තාලය සිංදු වන්නමේ ඉරට්ටිය ප්‍රස්තාර කර ඇති අන්දම හොඳින් අධ්‍යයනය කර තනිවම නිවැරදි ආකාරයට ඉරට්ටිය ප්‍රස්තාර කිරීමට අභ්‍යාස කරන්න.

**කුදිරඬි වන්නම.**

- 7 ශ්‍රේණියේ දී ඉගෙන ගත් කුදිරඬි වන්නමේ අඩව්ව නියමිත තාල රූපයට අනුව ප්‍රස්තාර කිරීම.
- මාත්‍රා 2 + 3 දෙතිත ( සුළු මැදුම් දෙතිත )

**අඩව්ව ඃ** තත් තරිගු තත් තකට ජෙජ් ජෙජ් කුඳත් තකට
තහර් ජිත් කිනං තකට තරිකිට තකට ජෙං තා

| /\ | | / | | | /\ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| තත් | - | ත | රි | ගු | තත් | - | ත | ක | ට |
| ජෙජ් | - | ජෙජ් | - | කි | නං | - | ත | ක | ට |
| ත | හර් | ජිත් | - | කි | නං | - | ත | ක | ට |
| තරි | කිට | ත | ක | ට | ජෙං | - | තා | - | - |

## කදම්භ පක්ෂි වන්නම.

- මාත්‍රා 3 තනි තිත ( මැදුම් තනි තිත )

**දවුල් පදය ඃ** ජිං ගතත් ගතත් ගත කුඳ
ජිංත ජිං තරිකිට ජිං තරිකිට තකට

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| ජිං | - | ග | තත් | - | ග | තත් | - | ග | ත | කු | ඳ |
| ජිං | - | ත | ජිං | තරි | කිට | ජිං | තරි | කිට | ත | ක | ට |

**තානම ඃ** තම්ද නත් තනත් තන තම් දන තානා තනෙන
තෙයි තනත් තනත් තන තම් දන තානා

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| + | තම් | ද | නත් | - | ත | නත් | - | ත | න | තම් | - |
| + | ද | න | තා | - | - | නා | - | - | ත | නෙ | න |
| + | තෙයි | ත | නත් | - | ත | නත් | - | ත | න | තම් | - |
| + | ද | න | තා | - | - | නා | - | - | - | - | - |

**ක්‍රියාකාරකම ඃ**

- වන්නමේ දවුල් පදය හා තානම ප්‍රස්තාර කර ඇති ආකාරය අධ්‍යයනයකර ස්වයං අභ්‍යාස කරන්න.

**කවිය ඃ** වත් පසන් ලෙසින් බබලන මෙන්නා නා ලිය
ගත් කැළුම් නොමින් නිබඳව විහිදීමා

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| + | වත් | ප | සන් | - | ලෙ | සින් | - | බ | බ | ල | න |
| + | මෙන් | - | නා | - | - | නා | - | - | ලි | ය | - |
| + | ගත් | කැ | ළුම් | - | නො | මින් | - | නි | බ | ඳ | ව |
| + | වි | හි | දී | - | - | මා | - | - | - | - | - |

**ක්‍රියාකාරකම ඃ**

- කදම්භ පක්ෂි වන්නම නිවැරදි නාද මාලාවට අනුව ගායනා කිරීමට අභ්‍යාස කරන්න. වන්නමේ මුල් කවි පද දෙක ප්‍රස්තාර කර ඇති ආකාරය අධ්‍යයනය කර ඉතිරි කවි පද කොටස් ද ප්‍රස්තාර කරන්න.

සිත් තොසින් ගොසින් ගිරි කුළ ගොස් යානාවෙක
පත් වෙමින් ගොසින් විල් අසලක සේමා

සිත් තොසින් පසන් කොවුලිඳු රුක් සෙවණැලි තුළ
ගත් තුඩින් නෙළා ඵල රස වැළඳීමා

මෙත් සිතින් අසන් වියතුනි දෙසවන් දී මෙම
කදම්බ පක්ෂී වන්නම රඟ මෙහෙමා

**කලාසම ඃ** ජිංත කුකුඳ තා තකට ///
ජිංත කුකුඳ ගතිත කුකුඳ
ජිංත කුකුඳ තා ගතත්

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජිං | - | ත | කු | කු | ඳ | තා | - | - | ත | ක | ට |
| ජිං | - | ත | කු | කු | ඳ | තා | - | - | ත | ක | ට |
| ජිං | - | ත | කු | කු | ඳ | තා | - | - | ත | ක | ට |
| ජිං | - | ත | කු | කු | ඳ | ග | ති | ත | කු | කු | ඳ |
| ජිං | - | ත | කු | කු | ඳ | තා | - | - | ග | තත් | - |

**ක්‍රියාකාරකම ඃ**

- කදම්බ පක්ෂි වන්නමේ කලාසමට අයත් පද කොටස් තාල තබා නිවැරදිව කියන්න. ඉහත ප්‍රස්තාර කර ඇති ආකාරය අධ්‍යයනය කර කලාසම ප්‍රස්තාර කිරීමට ස්වයංව අභ්‍යාස කරන්න.

## පතුරු නැටුම් කවි.

- මාත්‍රා 4 තනි තිත ( මහ තනි තිත )

ලොව සෙත් කරවන පත්තිනි සඳි නේ
සළුවක් අරගෙන සළු සලමින් නේ
වෙනසක් නොසිතා මගෙ ගුරුවරු නේ
පතුරක් අරගෙන රඟදෙමු තොසි නේ

| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | ලොව | සෙත් | - | ක | ර | ව | න | + | පත් | ති | නි | ස | ඳි | නේ | - |
| + | සළු | වක් | - | අ | ර | ගෙ | න | + | සළු | ස | ල | මින් | - | නේ | - |
| + | වෙන | සක් | - | නො | සි | තා | - | + | මගෙ | ගු | රු | ව | රු | නේ | - |
| + | පතු | රක් | - | අ | ර | ගෙ | න | + | රඟ | දෙ | මු | තො | සි | නේ | - |

**ක්‍රියාකාරකම ඃ**

- පහත දක්වා ඇති පතුරු නැටුම් කවි ඔබ ඉගෙනගත් මාත්‍රා 4 තනි තිතට අයත් නාද මාලාවට අනුව ගායනා කිරීමට අභ්‍යාස කරන්න. මෙම කවි ද නිවැරදිව ප්‍රස්තාර කරන්න..

01. සූරිය කුල ඇති හිරු දෙවියන් නේ
පෑවිය අණසක ලොව පවතින් නේ
කාරිය කරවා පහදා දෙන් නේ
පතුරු නැටීමට අවසර දෙන් නේ

02. අතුරු නැතිව සබයේ සිටිමින් නේ
මිතුරු ලෙසින් අපි පේලි සැදෙන් නේ
සතුරු වෙලා නොව දෙපිල බෙදෙන් නේ
පතුරු නටන්නට අවසර දෙන් නේ


සමන් එදිරිසිංහ. බප/කැල/ක්‍රිස්තුරාජ මහ විදුහල. වත්තල

## සවරං නැටුම් කවි.

- මාත්‍රා 3 තනි තිත ( මැදුම් තනි තිත )

දෑතට ගන්නේ සවරං පවන් සලන්නේ
සරඹ පාන්නේ පා පොඩි දෙක හසුරන්නේ
ගීත කියන්නේ සුම්හිරි තාල වයන්නේ
සබයට එන්නේ සවරං නැටුම් නටන්නේ

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| දෑ | - | ත | ට | ගන් | - | නේ | - | ස | ව | ර | ං |
| ප | වන් | - | ස | ලන් | - | නේ | - | - | - | - | - |
| ස | ර | ඹ | පා | - | න් | නේ | - | පා | - | පො | ඩි |
| දෙ | ක | හ | සු | රන් | - | නේ | - | - | - | - | - |
| ගී | - | ත | කි | යන් | - | නේ | - | සු | මි | හි | රි |
| තා | - | ල | ව | යන් | - | නේ | - | - | - | - | - |
| ස | බ | ය | ට | එන් | - | නේ | - | ස | ව | රං | - |
| නැ | ටුම් | - | න | ටන් | - | නේ | - | - | - | - | - |

**ක්‍රියාකාරකම :**

- පහත සඳහන් සවරං කවිය මාත්‍රා 3 තනි තිතට ප්‍රස්තාර කරන්න.

01. පෑවිය ගල් රැහැන් ජය රැස් වඩින්නට
වීරිය කර සිතින් ගණඳුරු හරින්නට
කාරිය තමයි සවරං ගෙන රඟන්නට
සූරිය දෙවි රජුනි අවසර දෙවන් මට

- මාත්‍රා 4 තනි තිත ( මහ තනි තිත )

මල් ගවසාලා කොණ්ඩය බැඳලා ඉණ තදකර සළු පැළඳ ගෙනේ
පියයුරු නිමලා එන ළැම උදුලා සළුපටකින් වසමින් යසිනේ
සිරියල් දීලා කට රතු කරලා නා දළු මෙන් තොල් දිලිසෙමිනේ
දෙවියන් වැඳලා සබයට බැසලා පටන් ගනිමු සවරන් රැගෙනේ

| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | මල් | ග | ව | සා | - | ලා | - | කොණ් | - | ඩ | ය | බැ | ඳ | ලා | - |
| + | ඉණ | ත | ද | ක | ර |ස | ළු | පැ | ළ | ඳ | ගෙ | නේ | - | - | - |
| + | පිය | යු | රු | නි | ම | ලා | - | එ | න | ළැ | ම | උ | දු | ලා | - |
| + | සළු | ප | ට | කින් | - | ව | ස | මින් | - | ය | සි | නේ | - | - | - |

**ක්‍රියාකාරකම ඃ**

- ඉහත සවරං කවියේ ඉතිරි පද දෙක ප්‍රස්තාර කරන්න.

**සිරසපාද කවි.**

- මාත්‍රා 3 තනි තිත ( මැදුම් තනි තිත )

සොලසා සංකය පළමුව පෙරුම් පිරූ බලයෙන්දා
මෙලෙස මුණිඳු වජ්‍රාසන වැඩහිඳ කෙලෙසුන් බින්දා
කළස රැගෙන මිහිකත දෙස් කී අනුහස් බලයෙන්දා
සිරස නළල පැමිණි දෝස දුරලන් මුණි බලයෙන්දා

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සො | ළ | සා | - | සං | - | ක | ය | ප | ළ | මු | ව |
| පෙ | රුම් | - | පි | රූ | - | බ | ල | යෙන් | - | දා | - |
| මෙ | ලෙ | ස | මු | ණි | ඳු | ව | ජ්‍රා | - | - | ස | න |
| වැ | ඩ | හි | ඳ | කෙ | ලෙ | සුන් | - | බි | න් | දා | - |

**ක්‍රියාකාරකම ඃ**

- ඉහත සිරස පාද කවිය නිවැරදි නාද මාලාවට අනුව ගායනා කර ඉතිරි කවි පද දෙක ප්‍රස්තාර කරන්න.

එදා නිරිඳු සදා කලිඟු වැදා නුවර සාගතයක් වැදුනේ
ලදා කුමරු බැඳා දෙමින් විදා වියරු වැද කුල්මත් වෙමිනේ
එදා ගිපිඳු සදා දුන්නු සදා කලිඟු නිරිඳුට සන්තොසිනේ
මුදා රෝග සිඳා හරින් වැදා සියළු පිරිපත හිස් මුදුනේ

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| එ | දා | - | නි | රි | ඳු | ස | දා | - | ක | ළි | ගු |
| වැ | දා | - | නු | ව | ර | සා | - | - | - | - | - |
| ග | ත | යක් | - | වැ | ඳු | නේ | - | - | - | - | - |
| ල | දා | - | කු | ම | රු | බැ | ඳා | - | දෙ | මින් | - |
| වි | දා | - | වි | ය | රු | වැ | ද | - | - | - | - |
| කුල් | - | මත් | - | වෙ | මි | නේ | - | - | - | - | - |

**ක්‍රියාකාරකම ඃ**

- ඉහත සිරස පාද කවිය නියමිත නාද මාලාවට අනුව ගායනා කර ඉතිරි කවි පද දෙක ප්‍රස්තාර කරන්න.

හිස මුව තුළ බෙල්ල දෙවුර දෑත එ දසගිලි අගිනේ
ළමැද උදර නාභිකටිය දෙඋකුල දෙකලව දෙදණෝ
කෙණ්ඩ බොලට දෙපිටි පතුල දසගිලි දසනිය අගිනේ
සුවිසි මුණිඳු අනුහසයෙන් ඔබෙ පිරිපත දුරහරිනේ

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| හි | ස | මු | ව | තු | ළ | බෙල් | - | ල | දෙ | වු | ර |
| දෑ | - | ත | එ | ද | ස | ගි | ලි | අ | ගි | නේ | - |
| + | ළමැ | ද | උ | ද | ර | නා | - | භි | ක | ටි | ය |
| දෙ | උ | කු | ල | දෙ | ක | ල | ව | දෙ | ද | ණෝ | - |
| - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කෙණ් | - | ඩ | බො | ල | ට | දෙ | පි | ටි | ප | තු | ල |
| ද | ස | ගි | ලි | ද | ස | නි | ය | අ | ගි | නේ | - |
| + | සුවි | සි | මු | ණි | ඳු | අ | නු | හ | ස | යෙන් | - |
| ඔ | බෙ | පි | රි | ප | ත | දු | ර | හ | රි | නේ | - |
| - | - | - | - | - | - | - | - | - | - | - | - |

**ක්‍රියාකාරකම ඃ**

- ඉහත සිරස පාද කවිය අදාල නාද මාලාවට අනුව ගායනා කර ප්‍රස්තාර කිරීමට අභ්‍යාස කරන්න.